M 431

# එලදායි ඉගෙනුම්-ඉගැන්වීම් වාතාවරණයක් සඳහා ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණිවල සිසුන්ගේ ගැටලුමය චර්යා කළමනාකරණයේ දී ගුරුවරුන් විසින් භාවිත කරනු ලබන ක්‍රමශිල්ප පිළිබඳ අධ්‍යයනයක්

ඩී.සී.පී ඉසනරත් 2004/M. Phil/06

1993 විද්‍යාවේදී උපාධිය (II පෙළ පන්ති සාමාර්ථය) - කොළඹ විශ්ව විද්‍යාලය

1996 පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - කොළඹ විශ්ව විද්‍යාලය

2000 අධ්‍යාපනපති උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය

University of Colombo Library Sri Lanka

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා
කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයට
ඉදිරිපත් කෙරෙන නිබන්ධනය
2012

UCLIB
567848

# සංක්ෂිප්තය


ආධුනික හෝ පළපුරුදු ගුරුභවතුනට තම වෘත්තියේදී මුහුණපෑමට සිදුවන වෙහෙසකාරී කටයුත්තක් ලෙස සිසුන්ගේ ගැටලුමය චර්යා කළමනාකරණය හැඳින්විය හැකි ය. මෙම අධ්‍යයනයේදී ජ්‍යෙෂ්ඨ ද්විතියික සිසුන් ඉලක්ක කරගෙන පර්යේෂණය සිදුකර ඇත. ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් නව යෞවනයන් වන අතර, සාපේක්ෂ ව කැපී පෙනෙන ලෙස ඔවුන්ගේ අවශ්‍යතා, චිත්තවේග ඉස්මතු වන අවධියක් ලෙස හැඳින්විය හැකි ය. පන්තිකාමර වාතාවරණයේ දී ඔවුන්ගේ ගැටලුමය චර්යා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය හීන කිරීමට බලපාන හේතුවක් වේ. මෙම අවස්ථාව ගුරුවරුනට අභියෝගාත්මක වන මුත් ඉගැන්වීමේ කාර්යයට අමතර ව සිසුන්ගේ චර්යා කළමනාකරණය කිරීම තුළින් ගුරු සිසු දෙපක්ෂයේ ම තෘප්තිමත් භාවයට එය හේතු වේ. සිසුන්ගේ ගැටලුමය චර්යා හඳුනාගැනීමටත්, උචිත ක්‍රමශිල්ප භාවිතයටත්, ගුරුවරුනට මනා නිපුණත්වයක් හා සංයමයක් තිබිය යුතු ය. බාධාකාරී සිසු ගැටලුමය චර්යා අවම වාතාවරණයක් තුළ ගුරුවරුන් හා සිසුන් වෙහෙසට පත් නොවී උපරිම කාර්යය නියුක්තියක් තුළින් අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගත හැකි ය.

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දී ඵලදායි ඉගෙනුම්-ඉගැන්වීම් වාතාවරණයක් පවත්වාගැනීම සඳහා ගුරුවරුන් විසින් භාවිත කරනු ලබන ක්‍රමශිල්ප පිළිබඳ ව විමර්ෂණය කර ඇත. ඒ සඳහා අරමුණු පහක් ඔස්සේ පර්යේෂණය සිදුකරන ලදී. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාවන සිසුන්ගේ ගැටලුමය චර්යා හඳුනාගැනීම, චර්යා කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ ව ගුරුවරුන්ගේ සංජානනය විමසා බැලීම, දැනට ගුරුවරුන් භාවිත කරන ක්‍රමශිල්ප පිළිබඳ ව විමසා බැලීම, ගුරුභවතුන් භාවිත කරන චර්යා කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ සිසුන්ගේ ආකල්ප විමසා බැලීම හා ඵලදායී ඉගෙනුම්-ඉගැන්ම් වාතාවරණයක් සඳහා උචිත ශිෂ්‍ය චර්යා කළමනාකරණ ක්‍රමශිල්ප හඳුනාගැනීම එම අරමුණු විය.

රත්නපුර අධ්‍යාපන කලාපයේ I කොට්ඨාසයේ ගැහැණු, පිරිමි හා මිශ්‍ර පාසල්, නියැදියට ඇතුළත් වන පරිදි 1 AB, 1C හා 2 වර්ගයේ සිංහල මාධ්‍යයේ පාසල් 12 ක් ස්ථරායන නියැදිකරණයට අනුව තෝරා ගන්නා ලදී. තව ද ජ්‍යෙෂ්ඨ ද්විතියික ශ්‍රේණිවල හර විෂයමාලාව උගන්වනු ලබන ගුරුවරුන් එක් පාසලකින් හත්දෙනා බැගින් තෝරා ගනු ලැබු අතර එක් පාසලකින් 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් දහය බැගින් සිසුන් 120 ක් අහඹු ලෙස තෝරා ගන්නා ලදී.

දත්ත රැස්කිරීමේ ප්‍රධාන මෙවලම වූයේ ගුරුවරුනට හා සිසුන්ට ලබා දෙන ලද ප්‍රශ්නාවලි ය. ඊට අමතර ව සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මගින් දත්ත රැස්කරන ලදී. නියැදියට තෝරාගත් ගුරුභවතුන් ස්ත්‍රීපුරුෂ භාව, වයස් කාණ්ඩ, අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපුරුද්ද, වෘත්තීය සුදුසුකම්, උගන්වන විෂයය හා සේවය කරන පාසල අනුව කාණ්ඩ හතකට බෙදන ලදී. ගැටලුමය චර්යා හඳුනාගැනීම සිසු චර්යා කළමනාකරණ ක්‍රමවල ඵලදායක බව සංජානනය සහ භාවිතය යන ක්ෂෙත්‍ර සම්බන්ධයෙන් ගුරුවරුන් දක්වන ප්‍රමුඛතාව ද තරා විශ්ලේෂණය ඇසුරින් සොයා බලන ලදී.

සිසුන් ස්ත්‍රී-පුරුෂ හා පාසල් වර්ගය අනුව කාණ්ඩ කරන ලද අතර ගුරුවරුන් භාවිත කරන චර්යා කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ ඔවුන්ගේ ආකල්ප අතර වෙනස්කම් පවතී ද සොයා බලන ලදී. ගුරුවරුන් භාවිත කරන ප්‍රමුඛත ම ක්‍රමශිල්ප මොනවා ද යන්න අධ්‍යයනයට ප්‍රමුඛතා විශ්ලේෂණය යොදාගන්නා ලදී. අවසාන වශයෙන් ගුරුවරුන්ගෙන් හා සිසුන්ගෙන් ලබාගත් තොරතුරු ඇසුරින් උචිත සිසු චර්යා කළමනාකරණ ක්‍රමශිල්ප හඳුනාගැනීමට ප්‍රමුඛතා විශ්ලේෂණ පාදක කරගන්නා ලදී.

මෙම පර්යේෂණයට අනුව ලබාගත් අනාවරණ මෙසේ දැක්විය හැකි ය. ගුරුභවතුන් කවර ආකාරයකට කාණ්ඩ කළ ද සිසු ගැටළු හඳුනාගැනීමේ දී, කළමනාකරණ ක්‍රමශිල්ප පිළිබඳ සංජානනයේ දී හා භාවිතයේ දී එකිනෙකට පරස්පර වූ තොරතුරු දක්වා නැත. ඒ අනුව සිසුන්ගේ ගැටලු සහගත බව කලාතුරකින් පවතින බව ද, සිසු ගැටලුමය චර්යා කළමනාකරණය සඳහා ක්‍රමශිල්ප භාවිතය ඉහළින් ඵලදායක වන බව ද, බොහෝ විට භාවිත කරන බව ද  දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය විය.

ගුරුවරුන් ගෙන් ලද තොරතුරු අනුව අනවසර කතා බහ, ඉගෙනුම් කාර්යයට රුචිකත්වයක් නොදැක්වීම, සාධන මට්ටමට ළඟා නොවී තිබීම හෝ අඩු නිපුණතාව, ගුරු අවධානය ලබාගැනීමට උත්සාහ ගැනීම හා පන්ති නීති, ක්‍රියා පිළිවෙත් නොසැලකීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාකාරී ගැටලුමය චර්යා ලෙස දැක්විය හැකි ය.

ගුරුවරුන්ගේ සංජානනයට අනුව සිසු චර්යා කළමනාකරණය සඳහා භාවිත කරන ක්‍රමශිල්ප අතුරින්, සිසුන්ගෙන් අපේක්ෂා කරන චර්යා පිළිබඳ ව ඔවුන් දැනුවත් කිරීම, පන්තිකාමරය තුළ බාධාකාරී තත්ත්වය අවම කිරීම සඳහා වූ ක්‍රමශිල්ප, සිසු අවශ්‍යතා හඳුනා ගැනීම හා ධනාත්මක උපස්ථම්භන ක්‍රමශිල්ප වඩාත් ම ඵලදායි ලෙස හඳුනා ගෙන ඇත.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීම සඳහා පන්තිකාමරය තුළ ගැටලුමය චර්යා ඇතිවීමට තිබෙන අවස්ථා අවම කිරීම, සිසු අවශ්‍යතා හඳුනාගැනීම, සිසුන් කෙරෙහි සෝදිසියෙන් සිටීම, උපස්ථම්භන භාවිතය හා ඉගෙනුම් කාර්යයෙන් අත්මිදෙන සිසු අවධානය නැවත ලබාගැනීම යන ක්‍රමශිල්ප ගුරුවරුන් විසින් දැනට බොහෝවිට භාවිත කරන බව අනාවරණය වී ඇත.

සිසුන්ගේ ආකල්පවලට අනුව ගුරුවරුන් භාවිත කරන ක්‍රමශිල්ප පිළිබඳ ව ලබා ගත් අනාවරණ මෙසේ විය. සිසු චර්යා පිළිබඳ ව සෝදිසියෙන් සිටීම, රුචිකත්වය වර්ධනය වන අයුරින් ඉගැන්වීම, උපස්ථම්භන මගින් චර්යා හැඩගැස්වීම, නීති පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීම හා පාඩමට බාධා නොවන පරිදි සිසුන්ගේ අනුචිත චර්යා පාලනය සඳහා වූ ක්‍රමශිල්ප මගින් පන්තිකාමරය බාධාකාරී තත්ත්වය අවම කිරිමට ගුරුවරුන් කටයුතු කරන බව අනාවරණය විය.

ගුරුවරුන්ගේ හා සිසුන්ගේ සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි ඇසුරින් උචිත සිසු චර්යා කළමනාකරණ ක්‍රමශිල්ප හඳුනා ගන්නා ලදී. ඉගෙනුම් ඉගැන්වීම් වාතාවරණය ඵලදායක ව හසුරුවා ගැනීම සඳහා ගුරුවරුන්ට භාවිත කළ හැකි ක්‍රමශිල්ප පිළිබඳ ව මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

ඒ අනුව සෑම ගුරුභවතෙකුට ම සිසුන්ගේ චර්යා කළමනාකරණය පිළිබඳ ව නිපුණත්වයක් ලබාදීමට පාඨමාලා හෝ ආයතනික වශයෙන් ලබා දෙන මනෝ විද්‍යාත්මක නිපුණත්වය ඉගෙනුම්-ඉගැන්වීම් වාතාවරණයේ සිදුවන අනර්ථකාරී කාල නාස්තිය පිටුදැකීම ට ඉතා වැදගත් වනු ඇත. සහයෝගී පන්තිකාමර වාතාවරණයක් තුළින් විෂය ඉගෙනුම පමණක් නොව අනාගත අභියෝග සඳහා නිවැරදි තීරණ ගැනීමට ද හැකි වනු ඇත. සිසුන්ගේ චර්යා කළමනාකරණය කරමින් ගුරුවරයා විසින් ලබා දෙන අධ්‍යාපනය, විශිෂ්ට වූ ජාතික අරමුණු සාක්ෂාත්කරණයට මහඟු අත්වැලක් වනු ඇත.

# Abstract

Managing students' disruptive behaviour can be recognized as a tiresome affair faced by teachers whether they are experienced or inexperienced. This educational research is narrowed to the senior secondary students. Students who are in the senior secondary levels are passing their adolescent age. Hence the arousal of their needs and emotions are prominent in this period. Their disruptive behaviours may be a reason to decrease the efficiency of teaching – learning process in the classroom. Though this condition is a challenge to teachers, by managing students' disruptive behaviour in addition to teaching, it would be a satisfaction for both teachers and students. There should be a good competency and collaboration in teachers to identify the problematic behaviours of students and to apply appropriate behavioural management techniques. In a classroom where there is a minimum level of students behavioural problems there would be a maximum level of task engagement and it would be help fast to could achieve the targets without any effort.

In this exploratory research it has been analyzed the strategies used by the teachers for having an effective teaching learning environment. For that the research has done according to five objectives. They are, identifying the problematic behaviours of students, perception of teachers on behavioural management techniques of students, identifying behavioural management techniques which were being used by teachers, finding out children's attitudes towards the behavioural management techniques which are being used by the teachers and indentifying the most appropriate behavioural management techniques for secondary school students.

Twelve schools were selected by striated sampling method including girls, boys, and mixed school under 1 AB. 1 C, and 2 categories from Ratnapura Zonal Division 1. 84 teachers were selected; seven from each school who were teaching core subjects. From each school 10 students were selected form grade 10 classes randomly for the sample.

The main data collection tools were questionnaires which were given to teachers and students. In addition to that interview and observation methods were used. Selected teacher sample was divided into seven categories based on their gender, age, educational qualifications, professional qualifications, experience, in teaching the subject and school where they were serving. The data collected from teachers on identifying students' problematic behaviours perception of efficiency in behavioural management techniques and their usage. Priority given by the teachers had been considered in analization

Students were categorized under their gender and the type of school to investigate whether there was any attitudinal discrimination among teachers and students regarding the behaviour management techniques used by teachers. To study what were the techniques used by teachers mostly, priority analization was done. Same method was applied for the last objective of identifying the most appropriate behaviour management techniques for students using the data collected from teachers and students.

The present study revealed that there were no contradictory results among teachers regarding identification of student behaviors, perception and using of behaviour management techniques however they categorized. According to that it was found that student behaviour problems exit rarely. Student behaviour management techniques which were used by teachers were highly efficient and were used frequently.

Present study has shown the most affected behavioural problems of students were taking without permission, lacking interest on academic affairs, Low academic achievement or not reaching to the achievement level, seeking teacher's attention and neglecting classroom rules and routine, according to the teachers view.

According to the teachers perception the most effective behavoiural techniques were making the students aware of what teachers expect from them, using techniques to minimize problematic situation in the class, identifying the needs of the students and using positive reinforcements.

For the enhancement of teaching learning process minimizing the problematic opportunities, identifying the needs, keeping alert on students, using reinforcement techniques and gaining attention of students who were excluded from learning were widely used by teachers.

According to the attitude of the students, keeping alert on students' behaviour, teaching as if developing the interest, modifying behaviours by reinforcement techniques, making awareness on rules and procedures and controlling disruptive behaviours without disturbing to main process of the classroom, were the techniques which were used by teachers, to minimize the problematic situation in the classroom.

Through interviews and questionnaires researcher could identifying the most suitable behaviour management techniques of students. To adjust the teaching learning climate fruitfully the research revealed the methods and techniques.

Researcher found out and recommended that practices suggested from this research, will be helpful to the teachers to plan and implement programmes to minimize problematic behaviour of students. Competency of using student behaviour techniques, it would be helpful to maximize learning time. Further making the classroom co-operative, finally the teacher would be able to do a great service to fulfill the national goals expected from the education.